ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

காணிஉபயோகக்கொள்கைத்திட்டமிடல்திணைக்களம்

**Land Use Policy Planning Department**

# 2016

## කාර්ය සාධන වාර්තාව

## செயற்திறன்அறிக்கை

# Performance Report

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

காணிஉபயோகக்கொள்கைத்திட்டமிடல்திணைக்களம்

Land Use Policy Planning Department

# 2016

## කාර්ය සාධන වාර්තාව

**செயற்திறன்அறிக்கை**

## Performance Report

# පටුන

1.හැඳින්වීම
1.1 දැක්ම
1.2 මෙහෙවර
1.3.අරමුණු
1.4.කාර්යභාරය

2. සංවිධාන ව්‍යුහය

3.මානව සම්පත් කළමනාකරණය
3.1 කාර්ය මණ්ඩල සංයුතිය
3.2 ස්ථාන මාරු වීම්
3.3 ආයතනික තොරතුරු
3.4 මානව සම්පත් සංවර්ධනය

4. මූල්‍ය කළමනාකරණය
4.1.වැය ඇස්තමේන්තුව -2016
4.2.භෞතික සම්පත් කළමනාකරණය -2016

5.සංවර්ධන කටයුතු
5.1.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම (ඉඩම් පරිහරණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම)
5.2.දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම.
5.3.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම.
5.4. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය
5.5. ජල මූලාශ්‍ර සහ ජල උල්පත් හඳුනාගැනීම
5.6. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම්
5.7. හායනයට පත් ඉඩම් පුනරුත්තාපනය කිරීමේ වැඩසටහන්.
5.8. ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ පාසැල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
5.9. විශේෂ අධ්‍යනය.
5.10.වෙනත් ව්‍යාපෘති.
5.11. වාර්ෂික වැඩ සැලැස්ම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම.
5.12.දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය.

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 01.හැදින්වීම

ශ්‍රී ලංකාව සඳහා විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම් ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා වර්ෂ 1983 දී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙන් පිහිටුවන ලදී. මෙම විෂයයේ කාලීන වැදගත්කම හා කාර්යභාරය පුළුල් වීමත් සමගම මෙම ආයතනය 2010 වසරේ සිට දෙපාර්තමේන්තුවක් ලෙස උත්ශ්‍රේණි ගත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට කොළඹ05 ලිපිනයෙහි පිහිටා ඇති අතර දිස්ත්‍රික් කාර්යාල 25 කින් යුක්ත වේ.1988 වර්ෂයේ දී දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් 25දෙනෙකු බඳවා ගත් අතරඔවුගෙන් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් 14 දෙනෙකු කුසලතා පදනම මත 2015.03.31 දින සිට සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) ලෙස පත් කරන ලදී.එමෙන්ම පුරප්පාඩුව පැවති එම තනතුරු 11ක් සඳහා තරඟ විභාගයක් මගින් සහකාර අධ්‍යක්‍ෂ (දි.ඉ.ප.) 11 දෙනෙකු 2016.11.01 දින සිට පත්කරන ලදී.ඒ අනුව 2016.12.31 වන විට සිටින මුළු සහකාර අධ්‍යක්‍ෂ (දි.ඉ.ප.) ගණන 23කි. 1994 සහ 1999 වර්ෂ වල සහකාර ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් 62 දෙනෙකු බඳවා ගන්නා ලද අතර දෙපාර්තමේන්තුවේ සිදු කරන කාර්යයන් වඩාත් විධිමත් කිරීම සඳහා 2005 වර්ෂය තුල දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සහකාර නිලධාරීන් 269 දෙනෙකු බඳවා ගෙන ඇත. පෙර පැවති සහකාර ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී හා ඉඩම් පරිහරණ සැලසුම් සහකාර යන තනතුරු නාමයන් "ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී" ලෙස එක් තනතුරු නාමයක්වශයෙන් 2014.12.11 දින සිට ඇති කරන ලදී. ඒ අනුව දැනට සිටින ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් ගණන 294කි.තවදුරටත් ක්ෂේත්‍ර වැඩ කටයුතු පුළුල් කිරීම සඳහා උපාධිධාරී අභ්‍යාසලාභී පදනම යටතේ 2013 වර්ෂයේසහ 2014 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් ලෙස 176 දෙනෙකු බඳවා ගෙන දීප ව්‍යාප්තව අනුයුක්ත කර ඇති අතර දැනට මෙම නිලධාරීන්ගේ සංඛ්‍යාව 193කි. ප්‍රධාන කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ ( කෘෂි ආර්ථික විද්‍යා ) තනතුර සඳහා සීමිත තරඟ විභාගයක් මගින් 2015.05.11 දින සිට නිලධාරියෙකු පත් කර ඇත.

### 1.1.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම

"ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත සහ තිරසාර ලෙස පරිහරණය කිරීම."

### 1.2.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශය

භූමිය පරිහරණය කරන්නන්ද ඇතුළුව අපගේ සියළු පාර්ශව කරුවන් තෘප්තිමත් වන සේ කාර්යක්ෂම මෙන් ම සේවයට කැප වූ කාර්ය මණ්ඩලයක් විසින් පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ත ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

### 1.3.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු 05 කි.

01.ශ්‍රී ලංකාව සඳහා සම්මත කර ගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම.

02.ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම.

03.සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත් පාරිසරික සමතුලිතතාවය රැකෙන පරිදි භාවිතා කිරීමට හැකි වනසේ උචිත තාක්ෂණික මග පෙන්වීම සිදු කිරීම.

04.භූමිය පදනම් කරගත් සංවර්ධන සැලසුම්වල දී එම සම්පතේ ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම.

05.විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම් කරණය පිළිබඳ දැනුම පුහුණුව හා අධ්‍යනය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.4 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

මෙම දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

**(01.)** ප්‍රධාන කාර්යයන් වශයෙන් ගැනෙන විශාල මට්ටමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු

**(02.)** අතිරේක කාර්යයක් වශයෙන් සැලකෙන කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු

මේ පිළිබඳ විස්තර සැකවින් පහත දැක්වේ.

<u>විශාල පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>

පළාත් දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම මේ යටතට ගැනේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සහ උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රමුඛත් වය ලබා දී ඇත.

<u>කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>

මේ යටතේ තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම,ඛාදනයට පත්ව ඇති කෘෂිකාර්මික බිම් පුනරුත්ථාපනය සඳහා සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීමත්,රාජ්‍ය ආයතන හා රජයේ පාසැල් පරිශ්‍රයන් වල ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන ස්ථාපිත කිරීමත් සහ විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව භාවිතා නොකර තිබෙන භූමි ප්‍රදේශ සඳහා භූමි යෝග්‍යතා අධ්‍යයන වාර්තා ලබා දීමත් සිදු කෙරේ.

ඉහත ප්‍රධාන කාර්යයන් වලට අමතරව එම කාර්යයන් වඩාත් පහසු කිරීම සඳහා

**01.**විවිධ මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා පාදක වන ඉඩම් තොරතුරු දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම

**02.**දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම.

**03.**ඉඩම් ප්‍රශස්ථ ලෙස භාවිත කිරීම පිලිබඳව රාජ්‍ය නිලධාරීන්,ගොවි ප්‍රජාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම.

**04.**ඉඩම් පරිහරණ ගැටලු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ කමිටු ස්ථාපිත කර පවත්වා ගෙන යාමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

## - සංවිධාන ව්‍යුහය -

## ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

# 03.මානව සම්පත් කළමනාකරණය

## 3.1. කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුරු සංඛ්‍යාව | පෙර වසරේ සිටි සංඛ්‍යාව | 2016 වර්ෂය තුළ සිදු වූ වෙනස් වීම් | | | | | ප්‍රවර්තන වසරේ සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විශ්‍රාම යෑම | ස්ථාන මාරු | | බඳවා ගැනීම් | උසස් වීම් | |
| | | | | | ගිය | පැමිණි | | | |
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - | - | - | - | - | 01 |
| 2. | අධ්‍යක්ෂපාලන | 01 | - | - | - | - | - | - | - |
| 3. | අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) | 01 | - | - | - | - | - | - | - |
| 4. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | - | - | - | - | 01 |
| 5. | අභ්‍යන්තර විගණක | 01 | - | - | - | - | - | - | - |
| 6. | ගණකාධිකාරී | 01 | - | - | - | - | 01 | - | 01 |
| 7. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. | 04 | 01 | - | - | - | - | - | 01 |
| 8. | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ( තොරතුරු පද්ධති ) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 9. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 10. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශෂ්‍ය විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 11. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 12. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (දි.ඉ.ප.) | 25 | 13 | 01 | - | - | 11 | | 23 |
| 13. | පරිගණක පද්ධති විශ්ලේෂක/ වැඩ සටහන් සම්පාදක | 01 | 01 | - | - | - | - | - | 01 |
| 14. | ඉඩම් පරිහරණ සැලසුම් | 294 | 294 | - | 02 | - | - | 11 | 281 |
| 15. | රාජ්‍ය කළමනාකරණ සහකාර (අධි පන්තිය ) | 01 | - | 01 | - | - | 01 | - | - |
| 16. | සංවර්ධන නිලධාරී | 200 | 193 | - | 03 | 03 | - | - | 193 |
| 17. | අයවැය සහකාර | 01 | - | - | - | - | - | - | - |
| 18. | රාජ්‍ය කළමනාකරණ | 50 | 28 | - | 06 | 05 | - | - | 27 |
| 19. | තොරතුරු සංනිවේදන තාක්ෂණික සහකාර | 02 | 02 | - | - | - | - | - | 02 |
| 20. | රියදුරු | 34 | 29 | - | 02 | 01 | | - | 28 |
| 21. | කාර්යාල කාර්ය සහායක | 37 | 36 | - | 02 | 02 | | - | 36 |
| 22. | ශිල්පිය සහායක | 25 | 19 | 01 | - | - | - | - | 18 |
| 23. | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 11 | 11 | - | - | - | | - | 11 |
| 24. | බංගලා භාරකරු | 01 | - | - | - | - | - | - | - |
| එකතුව | | 696 | 633 | 03 | 15 | 11 | 13 | 11 | 628 |

## 3.2. ස්ථාන මාරු පිළිබඳ විස්තර

## 3.3.ආයතනික කටයුතු

| | | පෙර වසර (2015) | ප්‍රවර්තන වසර (2016) |
|---|---|---|---|

| අනු අංකය | නම හා තනතුර | ස්ථාන මාරු වී ගිය | | ස්ථාන මාරු වී පැමිණි | | |
|---|---|---|---|---|---|---|
| | | දිනය | රාජකාරි ස්ථානය | අනුප්‍රාප්තිකයාගේ නම | දිනය | රාජකාරී ස්ථානය |
| 1. | ටී.එම්. ඉනෝදනී තඹවිට මිය සහකාර අධ්‍යක්ෂ | **2016.05.16** | ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත | - | - | - |
| 2. | ඩබ්.එම්.සී.කේ. ආරියරත්නමිය සංවර්ධන නිලධාරී | **2016.02.01** | ප්‍රා.ලේ. දෙහිඕවිට | එම්.ආර්.ජී.ආර්.පී.කේ. මඩහපොල මිය | **2016.02.05** | ප්‍රා.ලේ. නාඋල |
| 3. | යදර්ශනී ඥානරත්නම් මිය සංවර්ධන නිලධාරී | - | - | - | **2016.03.14** | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| 4. | ඊ.ඒ. යු.කේ. එදිරිසිංහ මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.01.01** | ප්‍රා.ලේ. කෑගල්ල | එච්.කේ.පී. හේවාවිතාරණ මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.01.01** | ප්‍රා.ලේ. කෑගල්ල |
| 5. | ඩබ්.ජී.සේන මයා රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.03.04** | ජාතික රෝහල | කේ.සී. සුමනසිරි මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.03.02** | ශ්‍රීපාලි විද්‍යාලය හොරණ |
| 6. | ජේ.ඩබ්.එස්.ආර්.සිල්වා මෙය රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.03.08** | පොලිස් අධිකාරී කාර්යාලය | එල්.වී.ඒ.යු. කුමාර මයා රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.03.01** | කලාප කම්කරු කාර්යාලය අනුරාධපුරය |
| 7. | ඒ.එම්.ජී. අධිකාරී මයා රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.05.09** | මුදල් අමාත්‍යාංශය | එස්.එම්.සී.පී. සෙනෙවිරත්න මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.06.01** | දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය - මාතලේ |
| 8. | කේ.ජී.එස්. මානින්ගමුව මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.06.01** | දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය - මාතලේ | කේ.එච්.ඩී.කේ.සී.සේනාරත්න මයා රාජ්‍ය කළමනාකරණ සහකාර | **2016.05.09** | නීතිපති දෙපාර්තමේන්තුව |
| 9. | ඒ.ඩබ්. රමීස් මයා කාර්යාල කාර්ය සහායක | **2016.07.01** | ප්‍රා.ලේ. තඹලගමුව | යු.එල්.ටී.යු. සෝමපාල මයා කාර්යාල කාර්ය සහායක | **2016.07.01** | ප්‍රා.ලේ. තඹලගමුව |
| 10. | යු.එච්.එම්.එස්. සෙනෙවිරත්න බණ්ඩා මයා රියදුරු | **2016.07.01** | ප්‍රා.ලේ. වැලිඔය | පී.එල්.එන්. ලියනගේමයා රියදුරු | **2016.07.01** | ප්‍රා.ලේ. වැලිඔය |
| 11. | - | - | - | එම්.ඒ. සංකල්ප මයා කාර්යාල කාර්ය සහායක | **2016.10.12** | ප්‍රා.ලේ. තිඹිරිගස්යාය |
| 12. | එච්.එම්.බී.ජයසිරි මයා සංවර්ධන නිලධාරී | - | - | - | **2016.07.13** | ප්‍රා.ලේ. වෙලිගපොල |

| අනු අංකය | විස්තර | සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව | සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | සේවයට බඳවා ගැනීම | 09 | - | - | 11 | - | - |
| 02 | විභාග පැවැත්වීම | 03 | - | - | 01 | - | - |
| 03 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | 04 | - | - | 02 | - | - |
| 04 | සේවය ස්ථිර කිරීම | 03 | - | - | 02 | - | - |
| 05 | උසස් කිරීම | 01 | - | - | 126 | - | - |
| 06 | වැටුප් වර්ධක ගෙවීම | සියළුම | සියළුම | - | සියළුම | සියළුම | - |
| 07 | සේවය දීර්ඝ කිරීම | - | - | - | - | - | - |
| 08 | බඳවා ගැනීම් පටිපාටි සැකසීම | - | - | - | 05 | - | - |
| 09 | සේවය හැර යාම | 01 | 01 | - | 01 | - | - |
| 10 | වැඩ තහනම් කිරීම | - | - | - | - | - | - |
| 11 | නැවත සේවයේ පිහිටුවීම | - | - | - | - | - | - |
| 12 | විනය පරීක්ෂණය | - | - | - | - | - | - |
| 13 | විදේශ නිවාඩු අනුමත කිරීම | 13 | - | - | 03 | - | - |
| 14 | විදේශ ශිෂ්‍යත්ව | 07 | - | - | - | - | - |
| 15 | අමාත්‍ය මණ්ඩල සංදේශ | - | - | - | - | - | - |
| 16 | ඇප ආරම්භ කිරීම | - | නැත | - | - | - | - |
| 17 | ඇප නිදහස් කිරීම | - | නැත | - | - | - | - |
| 18 | ණය අනුමත කිරීම | 151 | 151 | - | 127 | 127 | - |
| 19 | දේපළ | 09 | 09 | - | 05 | 05 | - |
| 20 | වාහන | - | - | - | - | - | - |
| 21 | වෙනත් - ආපදා | 142 | 142 | - | 122 | 122 | - |
| 22 | මුදා හැරීම් | 05 | - | - | 07 | - | - |

# 3.4.මානව සම්පත් සංවර්ධනය

## විදේශීය පුහුණු -2016 වර්ෂය

| අනු අංකය | පාඨමාලාව | නිලධාරියාගේ නම | තනතුර | විදේශ පුහුණුව ලැබූ රට | කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01. | කොළඹ සැලසුම් යෝජනා ක්‍රමය හා ඉන්දියානු තාක්ෂණ ආයතන යටතේ ඉංග්‍රීසි උසස් සහතික පත්‍ර පාඨමාලාව | කේ.ඩී.නිලන්ත මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඉන්දියාව | මාස 02 |
| 02 | ඕස්ට්‍රේලියානු ඉඩම් පරිපාලන කටයුතු හුවමාරුව | පී.එම්.ශාන්ති ප්‍රනාන්දු මිය | අධ්‍යක්ෂ ජනරාල් | ඕස්ට්‍රේලියාව | මාස 01 |
| 03 | සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ඉඩම් පරිහරණ සැලසුම්කරණයපිලිබඳ වැඩමුළුව | අයි.එල්.මොහොමඩ් සාහීර් මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | චීනය | සති 02 |
| 04 | පශ්චාත් උපාධිය | කේ.ඒ.ටී.එස්. කහඳවල මිය | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඕස්ට්‍රේලියාව | අවුරුදු 02 |
| 05 | උසස් ඵලදායිතාවක් උදෙසා මානසික සහතුලනය | එස්.ඩී. නන්දන මයා | ගණකාධිකාරී | ඉන්දියාව | දින 10 |
| | | බී.ඒ. ජයනන්ද මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම් ) | | |
| | | වී. වසන්තා කුමාරි මෙය | වැ/බ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | | |
| | | රුවිරා වික්‍රමරත්න මිය | සහකාර අධ්‍යක්ෂ ( දිස්ත්‍රික් ඉඩම් පරිහරණ ) | | |
| | | චන්ද්‍රා සෙනෙවිරත්න මිය | සහකාර අධ්‍යක්ෂ ( දිස්ත්‍රික් ඉඩම් පරිහරණ ) | | |
| | | අයි.ජී. ටිකිරි බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ ( දිස්ත්‍රික් ඉඩම් පරිහරණ ) | | |
| | | එම්.ඒ. නජීබ් මයා | සහකාර අධ්‍යක්ෂ ( දිස්ත්‍රික් ඉඩම් පරිහරණ ) | | |
| | | එන්.ඒ.එල්. සමරතුංග මිය | සහකාර අධ්‍යක්ෂ ( දිස්ත්‍රික් ඉඩම් පරිහරණ ) | | |
| 06 | නාගරික කළමනාකාරිත්ව සැලසුම් සඳහා අවකාශීය තොරතුරු තාක්ෂනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | ඒ.එන්.ජේ. ප්‍රනාන්දු මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඉන්දියාව | මාස 02 |
| 07 | තිරසාර ග්‍රාමීය සංවර්ධනය සඳහා ස්වභාවික සම්පත් කළමනාකරණ පිළිබඳ පාඨමාලාව | ටී. ජෙගදීශ්වරන් මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඉන්දියාව | මාස 01 |
| 08 | ඉඩම් සංවර්ධන ප්‍රතිපත්ති කළමනාකරණය | පී.එස්. එදිරිවික්‍රම මෙය | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | කොරියාව | සති 03 |

**<u>දේශීය පුහුණු</u>**

| අනු අංකය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව | තනතුර | ආයතනය | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01 | ඵලදායිතා පුහුණු වැඩසටහන - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | නිලධාරීන් 02 | ඉඩම් පරිහරණ සැලසු නිලධාරී/ රාජ්‍ය කළමනාකරණ සහකාර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- යාපනය | දින 01 |
| 02 | බහු නිර්ණායක විශ්ලේෂණය (Multi Criteria Analysis) | නිලධාරීන් 15 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) සහකාර අධ්‍යක්ෂ වරුන් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | UNREDDසංවිධානය | දින 01 |
| 03 | GIS පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන | නිලධාරීන් 17 | සංවර්ධන නිලධාරී/ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | පශ්චාත් උපාධි ආයතනය - පේරාදෙණිය | දින05 |
| 04 | GIS, GPS පුහුණු වැඩසටහන | නිලධාරීන් 23 | සංවර්ධන නිලධාරී/ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - මොණරාගල | දින 01 |
| 05 | හරිත ඵලදායිතාව පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව | නිලධාරීන් 04 | රාජ්‍ය කළමනාකරණ සහකාර /සංවර්ධන නිලධාරී/ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඵලදායිතා ලේකම් කාර්යාලය | දින 01 |
| 06 | ඉංග්‍රීසි භාෂා කථන පුහුණුව | නිලධාරීන් 01 | වැ/බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | මාස 06 |
| 07 | ගිනි නිවීමේ උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව | | ප්‍රධාන කාර්යාලයේ සියළුම නිලධාරීන් | ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුව | දින 01 |
| 08 | පශ්චාත් උපාධි පාඨමාලාව | නිලධාරීන් 03 | සංවර්ධන නිලධාරී/ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | කැළණිය විශ්ව විද්‍යාලය/ පේරාදෙණිය විශ්ව විද්‍යාලය | අවුරුදු 02 |
| 09 | මූලික ඵලදායිතා සංකල්ප පිළිබඳ එක්දින වැඩමුළුව | නිලධාරීන් 02 | ගණකාධිකාරී / වැ/බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | ඵලදායිතා ලේකම් කාර්යාලය | දින 01 |
| 10 | QGIS වලින් SHAPE FILE UPDATE කිරීම සම්බන්ධ පුහුණුව | නිලධාරීන් 13 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී)/ සංවර්ධන නිලධාරී | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - මඩකලපුව | දින 03 |
| 11 | කාර්ය මණ්ඩල පුහුණු හා සහභාගීත්ව ග්‍රාමීය හා ගැමි විමසුම | නිලධාරීන් 30 | සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) /ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී/සංවර්ධන නිලධාරී | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - බදුල්ල | දින 02 |
| 12 | ව්‍යාපෘති වාර්තා රචනය | නිලධාරීන් 05 | සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | දින 05 |
| 13 | උසස් සහතික පත්‍ර පාඨමාලාව | නිලධාරීන් 01 | වැ/බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | විවෘත විශ්ව විද්‍යාලය | මාස 06 |

# 04.මූල්‍ය කළමනාකරණය- 2016

## 4.1.වැය ඇස්තමේන්තු

| | පෙර වර්ෂය | | | වියදමේ ප්‍රතිශතය(%) | ප්‍රවර්තන වර්ෂය | | | වියදමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | |
| 1 ව්‍යාපෘති 1 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 281,210,000 | 281,652,192 | 740,746 | 100.16 | 300,565,000 | 299,934,674 | 630,326 | 99.79 |
| වෙනත් පුනරාවර්තන | 41,757,000 | 39,013,938 | 1,560,124 | 93.43 | 48,500,000 | 45,381,142 | 3,118,858 | 93..57 |
| ප්‍රාග්ධන | - | - | - | - | - | - | - | - |
| 2001 | 20,000,000 | 18,611,099 | 1,388,901 | 93.06 | 28,862,000 | 24,221,911 | 4,640,089 | 83..92 |
| 2002 | 1,800,000 | 528,103 | 1,271,897 | 29.34 | 1,900,000 | 1,862,971 | 37,029 | 98..05 |
| 2003 | 4,200,000 | 2,718,049 | 1,481,951 | 64.72 | 4,350,000 | 3,557,098 | 792,902 | 81..77 |
| 2102 | 3,000,000 | 2,489,252 | 510,748 | 82.98 | 2,500,000 | 2,180,223 | 319,777 | 87.21 |
| **2103** | 2,000,000 | 1,965,833 | 34,167 | 98.29 | 2,000,000 | 1,947,886 | 52,114 | 97.39 |
| **2105** | 32,000,000 | 27,698,096 | 4,301,904 | 86.56 | 28,400,000 | 27,891,979 | 508,021 | 98.21 |
| **2401** | 2,000,000 | 1,981,741 | 18,259 | 99.09 | 2,000,000 | 1,971,004 | 28,996 | 98.55 |
| **2** ව්‍යාපෘති 2 | - | - | - | - | - | - | - | - |
| පෞද්ගලික පඩිනඩි | - | - | - | - | - | - | - | - |
| වෙනත් පුනරාවර්තන | - | - | - | - | - | - | - | - |
| ප්‍රාග්ධන | - | - | - | - | - | - | - | - |
| 2001 | - | - | - | - | - | - | - | - |
| 2002 | - | - | - | - | - | - | - | - |
| 2003 | - | - | - | - | - | - | - | - |
| 2101 | - | - | - | - | - | - | - | - |
| එකතුව | 387,967,000 | 376,658,303 | 11,308,697 | | 419,077,000 | 408,948,888 | 10,128,112 | |

### රජයේ අත්තිකාරම් බී ගිණුම

| සීමාවන් | පෙර වර්ෂය (2015 ) | | ප්‍රවර්තන වර්ෂය (2016) | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| උපරිම වැය සීමාව | 20,920,000 | 22,205,301 | 21,000,000 | 20,906,777 |
| අවම බැර සීමාව | 10,920,000 | 15,029,000 | 11,000,000 | 17,107,683 |
| උපරිම හර ශේෂ සීමාව | 65,000,000 | 55,149,226 | 67,000,000 | 58,948,321 |

## 4.2.භෞතික සම්පත් කළමනාකරණය - 2016

වංචල දේපළ

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්ත්වය | 2016-වර්ෂය තුළ සිදු වන වෙනස් වීම් | | | | වසර අවසානයේ පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම | මිල දී ගැනීම | වෙන්දේසි කිරීම | ඉවත් කිරීම | |
| 1 | බර වාහන | - | - | - | - | - | - |
| 2 | කැබ් රථ | **20** | - | - | - | - | **20** |
| **3** | මෝටර් රථ | **01** | - | - | - | - | **01** |
| 4 | වෑන් | **03** | - | - | - | - | **03** |
| 5 | ජීප් රථ | **12** | - | - | - | - | **12** |
| 6 | මෝටර් සයිකල් | **0** | - | - | - | - | **0** |
| 7 | පාපැදි | **01** | - | - | - | - | **01** |
| 8 | ඩුප්ලිකේටර් යන්ත්‍ර | **01** | - | - | - | - | **01** |
| 9 | ඡායා පිටපත් යන්ත්‍ර | **31** | - | - | **01** | - | **30** |
| 10 | කී බෝර්ඩ් | **173** | - | **08** | **05** | **04** | **172** |
| **11** | මවුස් | **173** | | **08** | **01** | **12** | **168** |
| 12 | Speaker system | – | - | - | - | - | **0** |
| 13 | UPS | **173** | - | **16** | **09** | **14** | **166** |
| 14 | CPU | **173** | - | **8** | **05** | **01** | **175** |
| 15 | CD Writer | - | - | - | - | **02** | - |
| **16** | මොනිටර් | **173** | | **13** | **07** | **05** | **174** |
| 17 | පරිගණක ප්‍රින්ටර්ස් | **48** | - | **08** | **02** | **01** | **53** |
| 18 | ලැප්ටොප් පරිගණක | **62** | - | **06** | - | - | **68** |
| 19 | ෆැක්ස් යන්ත්‍ර | **32** | - | **02** | **03** | - | **31** |
| 20 | යතුරු ලියන | **01** | - | - | - | **01** | **0** |
| 21 | සේප්පු | **01** | - | - | - | - | **01** |
| 22 | කැමරා (ඩිජිටල් ) | **25** | - | **02** | **02** | - | **25** |
| 23 | රූපවාහිනී යන්ත්‍ර | **02** | - | - | - | - | **02** |
| 24 | රේඩියෝ යන්ත්‍ර | **0** | - | - | - | - | **0** |
| 25 | ශීතකරණ | **01** | - | **01** | - | - | **02** |
| 26 | පරිගණක ප්‍රින්ටර්ස් (වර්ණ) ) | **24** | - | - | **01** | - | **23** |
| **27** | ස්කෑනර් යන්ත්‍ර | **27** | - | - | **01** | - | **26** |
| 28 | මල්ටි මීඩියා උපකරණ | **30** | - | **03** | - | - | **33** |
| 29 | ජී.පි.එස් උපකරණ | **113** | - | **41** | **03** | **02** | **149** |
| 30 | අන්තර්ජාල පහසුකම් **( ADSL)** | **03** | - | - | - | **01** | **02** |
| 31 | ස්ලයිඩ් ප්‍රෝජෙක්ටර් | **01** | - | - | - | **01** | **0** |
| 32 | රාක්ක | **03** | - | **07** | **01** | **02** | **07** |
| 33 | Hard Disk | **01** | - | **01** | | **01** | **01** |
| 34 | ලිපිකරු මේසය | **10** | - | **39** | **07** | **03** | **39** |
| 35 | පරිගණක මේස | - | - | **17** | | | **17** |
| 36 | කබඩ් | **09** | - | **25** | **08** | **01** | **25** |
| 37 | පුටු | **72** | - | **116** | **66** | **06** | **116** |
| 38 | වතුර ෆිල්ටරය | - | - | **03** | - | - | **03** |
| 39 | Print & Scanner Machine | - | - | **01** | - | - | **01** |
| 40 | Sofa set | - | **01** | - | - | - | **01** |
| 41 | Soil Reciprocating | - | - | **01** | - | - | **01** |
| 42 | විදුලි කේතලය | **05** | - | **02** | **04** | **01** | **02** |
| 43 | Rice Cooker /Gas Cooker | - | - | **02** | - | - | **02** |
| 44 | Moter | - | - | **01** | - | - | **01** |
| 45 | Gas Cylinder | - | - | **01** | - | - | **01** |
| 46 | ඇඳන් | **03** | - | **01** | **03** | - | **01** |
| 47 | DiningTable | - | - | **01** | - | - | **01** |
| 48 | Pen drive | **05** | - | - | - | **05** | **0** |
| 49 | සිතියම් කැබිනට් | **05** | - | **04** | **03** | **02** | **04** |
| 50 | වේලා සටහන් යන්ත්‍රය | **01** | - | - | **01** | - | **0** |
| 51 | විදුලි පංකා | **06** | - | **02** | **06** | - | **02** |

# 05.සංවර්ධන කටයුතු

## 5.1.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම

**ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත.යම්කිසි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක පවත්නා ඉඩම් පරිහරණ රටාව සහ ඉඩම් පරිහරණ ගැටළු හඳුනාගෙන,ඊටහේතු පාදක වන සාධක විශ්ලේෂණය කර, එම ගැටළු අවම කිරීමට අවශ්‍ය උපාය මාර්ගික යෝජනා ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මක් මඟින් සිදුකෙරේ.එමගින් මෙරට භූමි සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම සිදුකරනු ලබයි.එසේ වුවද බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල භූමි පරිහරණය සැලකූ විට කොට්ඨාශයේ භූමියෙන් වැඩි ප්‍රතිශතයක් දැනටමත් විවිධ කාර්යයන් සඳහා භාවිතා කර ඇති බව පැහැදිලි වේ.පවත්නා පරිහරණයේ සිදු කල යුතු වැඩිදියුණු කිරීම් සඳහා සංරක්ෂණය කල යුතු ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහාත් මෙම සැලසුම් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.**

මේ යටතේ **2016.12.31** දින වන විට අවසන් කරන ලද ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තා**262** ක් ප්‍රධාන කාර්යාලයට ලැබී ඇත. අදාළ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තා වලින් නිර්දේශ ක්‍රියාත්මක කිරීමටව්‍යාපෘති **330** ක් සඳහා ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර, **2016.12.31** දිනට එහි භෞතික ප්‍රගතිය **100%** ක් වේ.

## <u>2016 වර්ෂයේ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳප්‍රගතිය දැක්වෙන ඡායාරූප</u>

කෑගල්ල දිස්ත්‍රික්කය - කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයරුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය





කළුතර දිස්ත්‍රික්කය - අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

කළුතර දිස්ත්‍රික්කය - කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය





කුරුණෑගල දිස්ත්‍රික්කය - මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

කුරුණෑගල දිස්ත්‍රික්කය - කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය





## 5.2. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික් කාර්යාල හරහා මෙහි සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.

මෙම කමිටු වල කාලීන වැදගත්කම අනුව සෑම දිස්ත්‍රික්කයකම ක්රියාත්මක වේ.දිස්ත්‍රික් ලේකම්වරයා මෙම කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන අතර සහකාර අධ්‍යක්‍ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු ඇත. මෙම කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු අතර විශේෂ හා හදිසි රැස්වීම් කැඳවීමට දිසාපති/දිස්ත්‍රික් ලේකම්ට පිළිවන.

කමිටුවට ඉදිරිපත් වන කරුණක් පිලිබඳව තීරණයක් ගැනීම සඳහා විස්තරාත්මක අධ්‍යනයක් කලයුතු යැයි හැඟෙන අවස්ථාවලදී ඒ සඳහා කමිටු සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් පත්කලහැකි අතර අවශ්‍ය පරිදි ඒ ඒ විෂයයන් සඳහා විශේෂඥයන් ද අනු කමිටුවට පත්කළ හැකිය.

කමිටුවේ කාර්ය භාරය :-

01. දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රයෝජනයට ගත හැකි දැනට හිස්ව පවතින ඉඩම් පිළිබඳ තොරතුරු සොයා බැලීම හා වාර්තා කිරීම.

02. ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය තුළ යෝජිත සංවර්ධන වැඩසටහන් වලට අනුව ප්‍රමුඛතාවය දිය යුතු අංශ නිශ්වය කිරීම.

03. නාගරික සහ ග්‍රාමීය අංශයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.

04. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නැගෙන විවිධ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම සහ නිදහස් කිරීම

ඉහත ප්‍රධාන කාර්යයන්ට අමතරව පහත සඳහන් කරුණුද දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

01. දිස්ත්‍රික්ක තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු සම්බන්ධව ජාතික මට්ටමේකමිටුවටපූර්වදැනුම්දීමටඅදාළකටයුතුකිරීම.

02. ඉඩම් පරිහරණ වැඩිදියුණු කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදනය සඳහා මග පෙන්වීම.
03. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.
04. දිස්ත්‍රික්කය සඳහා සකස් කර ඇති ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ භූමි පරිහරණය සම්බන්ධ පසු විපරම් කටයුතු කිරීම.
05. දිස්ත්‍රික්කය තුළ ඉඩම් පරිහරණයට සම්බන්ධ ආයතන අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම.

06. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මේ නිර්දේශ,සාකච්ඡාකර අනුමත කිරීම.

## 2016 වර්ෂයේ පවත්වනු ලැබූ දිස්ත්‍රික් කමිටු අවස්ථාවන්

අම්පාර දිස්ත්‍රික්කය



කිලිනොච්චි දිස්ත්‍රික්කය



මාතලේ දිස්ත්‍රික්කය



බදුල්ල දිස්ත්‍රික්කය



ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ සංයුතිය:-

01. දිස්ත්‍රික් ලේකම් (සභාපති )
02. ප්‍රාදේශීය ලේකම්වරු
03. සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) ලේකම්

04. පළාත් ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස්
05. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාපෘති )
06. දිසා වන නිලධාරි
07. මිනින්දෝරු අධිකාරී
08. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්
09. නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ
10. පළාත් පාලන සහකාර කොමසාරිස්
11. සහකාර අධ්‍යක්ෂ, අපනයන බෝග
12. කළමනාකරු, කුඩාතේ වතු සංවර්ධන දෙපාර්තමේන්තුව
13. නියෝජ්‍ය අධ්‍යක්ෂ, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
14. ප්‍රාදේශීය කළමනාකරු, පොල් වගා කිරීමේ මණ්ඩලය
15. සහකාර අධ්‍යක්ෂ ,මධ්‍යම පරිසර අධිකාරිය

මීට අමතරව අවශ්‍ය අවස්ථාවල දී දිස්ත්‍රික් ලේකම්ගේ අභිමතය පරිදි වෙනත් දෙපාර්තමේන්තු/ආයතන සඳහා සාමාජිකත්වය ලබා දිය හැකිය.

මේ අනුව 2016 වර්ෂයේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු 55ක් පැවැත්වීමට සැලසුම් කල අතර කමිටු 64ක් පවත්වා ඇත. එක් කමිටුවක් සඳහා වෙන් කරන ලද මුදල රු.3000/= කි.

## 5.3.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ උපදෙස් හා මග පෙන්වීම් මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් මෙම කමිටුව ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ ඉඩම් පරිහරණ සැලසුම් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ සම්බන්ධීකරණය මත සිදුවේ. ප්‍රාදේශීය ලේකම්වරයා සභාපතිත්වය දරණ මෙම කමිටුවේ ලේකම්වරයා ලෙස ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරියා කටයුතු කරනු ඇත.

කමිටුවේ කාර්යභාරය :-

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණය සම්බන්ධව ප්‍රමුඛතාවය දිය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
03. කොට්ඨාශ තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු හඳුනා ගැනීම, ඒවාට විසඳුම් ලබාදීම සහ අවශ්‍ය අවස්ථා වලදී දිස්ත්‍රික් කමිටුව වෙත වාර්තා කිරීම.
04. ඉඩම් පරිහරණ සැලසුම් යෝජනා මත පදනම් වූ දිගුකාලින හා කෙටිකාලින යෝජනා සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙළක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කල යුතු කාර්යයන් ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීම. මෙය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාර්ෂික සැලැස්මට ඇතුළත් කරගත යුතුය.
05. ජාතික/දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු වලට ඉඩම් පරිහරණ කාර්යයන් පිලිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.
06. ඉඩම් බෙදා දීම හා වෙන්කරදීම,ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව මගින් අවශ්‍ය නිර්දේශ ලබාදීම.
07. රජයේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම කමිටුවේ නිර්දේශය මත සිදුවේ.

08. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ඉඩම් පරිහරණ සැලසුම් කමිටු සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම.
09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.
10. විවිධ කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීමේදී යෝග්‍යතාවය පදනම් කරගෙන අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
11. ප්‍රාදේශීය මට්ටමෙන් ඉඩම් පරිහරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා දිස්ත්‍රික් දත්ත පද්ධතිය හා ඒකාබද්ධ කිරීම.

කමිටුවේ සංයුතිය :-

01. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
02. ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි (ලේකම්)
03. ඉඩම් නිලධාරි/ජනපද නිලධාරි
04. කෘෂිකර්ම උපදේශක
05. ගොවිජන සංවර්ධන නිලධාරි
06. අඩවි වන නිලධාරි
07. සහකාර මිනින්දෝරු අධිකාරි
08. පොල්/තේ/රබර්/බහු වාර්ෂික බෝග සඳහා වූ ව්‍යාප්ත නිලධාරීන්
09. සත්ව සංවර්ධන උපදේශක
10. පරිසරනිලධාරි
11. ගොවිජන සංවිධානයේ නියෝජිතයෙක්
12. වැවිලි සහ වතු වගා අංශයේ අදාළ නියෝජිතයින්
13. ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු වලට අදාළ රාජ්‍ය නොවන සංවිධාන වල නියෝජිතයින්

2016වර්ෂයේ දී මෙවැනි කමිටු 331ක් පැවැත්වීමට ඉලක්ක කල අතර කමිටු 392 ක් පවත්වා ඇත. ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල, ප්‍රාදේශීය කෘෂිකාර්මික කමිටුව එයට සමගාමීව පවත්වා අදාළ ඉලක්කය ලගාකර ගත්තද මුදල් වැය වීමක් සිදු වී නොමැත. මෙම එක් කමිටුවක් පැවැත්වීම සඳහා රු.1500/= ක මුදලක් වෙන් කර ඇත.

<u>2016 වර්ෂයේ පවත්වනු ලැබූ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු අවස්ථාවන්</u>

යාපනය දිස්ත්‍රික්කය - නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



කිලිනොච්චි දිස්ත්‍රික්කය - පච්චිලයිපල්ලි ප්‍රාදේශීය ලේකම්



## 5.4. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ භූමි භාවිතය පිලිබඳ විවිධ කාල වකවානු වල සකස් කල ඉඩම් පරිහරණ දත්ත ඇතත් යාවත්කාලීන කල තොරතුරු වල හිඟය සැලසුම් සකස් කිරීමේ දී මූලික අඩුපාඩුවක්ව පවතී. එම අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා පොදු මූලධර්ම අනුව සකස් කල මාර්ගෝපදේශයක් ඔස්සේ සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලින කිරීම මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයක් ලෙස ආරම්භ කෙරුණි. විවිධ ආයතන සහ දෙපාර්තමේන්තු මෙන්ම දිස්ත්‍රික් ලේකම් වරුන් හා ප්‍රදේශිය ලේකම් වරුන් හට ඉඩම් භාවිතය පිලිබඳ නව දත්ත නොමැති වීම විශාල ගැටලුවක් වන නිසා එම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමටත් මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු වඩාත් ක්‍රමවත් කිරීමටත් මෙම වැඩ සටහන බෙහෙවින්ම ඉවහල් වේයැයි අපේක්ෂා කරනු ලැබේ.

මෙම සමීක්‍ෂණය වර්ෂ 5කට වරක් සිදු කිරීම සඳහා දැනට යෝජනා කර ඇත. 2016 වර්ෂයේදී 1:10,000 පරිමාණ සිතියම් 1830 ක් මඟින්සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලින කිරීම අරමුණු කර තිබු අතර 2016.12.31 දිනටසිතියම්1519ක්යාවත්කාලීන කිරීමේ ක්‍ෂේත්‍ර කටයුතුසම්පූර්ණ කර ඇත. එමෙන්ම සිතියම් 739 භූගෝල විද්‍යා දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත.

## 5.5. ජල මූලාශ්‍ර හා ජල උල්පත් හඳුනා ගැනීම

ජලය, ශ්‍රී ලංකාව සතු ප්‍රධානතම ස්වභාවික සම්පතක් වන අතර, එය අතීතයේ පටන්ම මෙරට ආර්ථික සංවර්ධනයට දායකවන ප්‍රධානතම සාධකයක් ද වේ. කෘෂිකාර්මික රටක් වූ ශ්‍රී ලංකාව අතීතයේ සිට අද දක්වා ම විවිධාකාර වූ වාරි කර්මාන්ත තුලින් මෙරට කෘෂි ආර්ථිකයට ලබා දී ඇති දායකත්වය සුවිශේෂී එකකි. ඒ හැරුණු කොට කර්මාන්ත, සේවා සැපයීම, පානීය ජල අවශ්‍යතා පමණක් නොව විනෝදාස්වාදක කටයුතු හා සංචාරක කර්මාන්තයටත්, විදුලිය නිෂ්පාදනයටත්, ශ්‍රී ලංකාවේ ජල සම්පත ඉතා වැදගත් මූලාශ්‍රයක් බවට පත් වී තිබේ. එබැවින් ජල මූලාශ්‍ර හා ඒවායේ රක්‍ෂිත හා ප්‍රභව ප්‍රදේශ ආරක්‍ෂාව, සංරක්‍ෂණ හා තිරසාර පැවැත්ම මෙරට සමාජ, ආර්ථික සංවර්ධනයට පමණක් නොව පාරිසරික සංතුලනය හා ජෛව විවිධත්වය ආරක්‍ෂා වීමට ද අතිශය වැදගත් සානුබලයක් ලබාදෙනු ඇත.

මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ඉඩම් පිලිබඳ පාර්ලිමේන්තු උපදේශ කාරක සභාවේ නියමය පරිදි ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර හා ජල උල්පත් සංරක්ෂණය කිරීම පිලිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. එපමණක් නොව මෙම ප්‍රතිපත්තිය අංක 1894/3 හා 2014.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර තිබේ.

2015 වර්ෂය තුල දිස්ත්‍රික්ක 18 ක ජල මූලාශ්‍ර පිහිටීමේ විස්තර වාර්තාවක් සකස් කර දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත ඉදිරිපත් කර එය දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව හරහා ක්ෂේත්‍ර පරීක්ෂණය කර සංරක්ෂණය හෝ ආරක්ෂා කල යුතු ජල මූලාශ්‍ර සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා පියවර ගෙන ඇත. එමෙන්ම එම වාර්තා අනුසාරයෙන් ජාතික පාරිසරික පනත යටතේ පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස නම්

කිරීමේ මූලික කටයුතු සඳහා තොරතුරු මධ්‍යම පරිසර අධිකාරිය වෙත බාර දෙන ලදී. ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ පුරෝගාමී ආයතනවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම සඳහා **2015.11.24** දින වැඩ මුළුවක්දපවත්වාකරුණු සාකච්ඡා කර ඇත.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම තුලින් ගංගා ඇල දොළ රක්ෂිත සීමා සහ සියලු ආකාරයේ අනෙකුත් ජල මුලාශ්‍ර වල පිහිටීම සිතියම් ගත කරනු ලබන අතර ඒවායේ රක්ෂිත සීමා හඳුනා ගැනීමත් ආරක්ෂා කල යුතු ප්‍රදේශ රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කිරීමත් සඳහා වූ ක්‍රියා මාර්ග ගනු ඇත.

**2016** වර්ෂයේදී ජල මූලාශ්‍ර හා ජල උල්පත් සංරක්‍ෂණය කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්කයකට එක බැගින් වැඩසටහන් **25** ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කල අතර, එම වැඩසටහන් **25** ම සාර්ථකව නිම කර ඇත.

<u>බදුල්ල දිස්ත්‍රික්කය - රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය</u>

සංරක්ෂණයට පෙර අවස්ථාව



සංරක්ෂණයෙන් පසු අවස්ථාව



<u>පාංශු සංරක්ෂණ දැනුවත් කිරීම</u>

කුරුණෑගල දිස්ත්‍රික්කය - මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



## 5.6. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන ක්‍රියාත්මක කිරීම

මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ ඉඩම් පරිහරණ ගැටළු බහුල වශයෙන් පවතින ගමක හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාශයක නිශ්චිත පවුල් සංඛාවක් තෝරාගෙන ඔවුන්ගේ ඉඩම් විද්‍යාත්මක පරිහරණය සඳහා යොමු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කිරීමයි. විශේෂයෙන් ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවක් ගම තුළ ස්ථාපිත කර ඉඩම් පරිහරණය හා සම්බන්ධ ගැටළු ඉඩම් ලාභීන්ගෙන්ම

හඳුනාගැනීම සිදුවේ. එම ගැටළු විසඳා ගැනීම සඳහා අදාල දායක ආයතන සම්බන්ධ කර ගනිමින් එම ගැටළු අවම කර තම ඉඩමේ උපරිම වටිනාකම ප්‍රතිලාභීන්ට ලබා ගත හැකි වන සේ වැඩසටහන් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වේ. මේ තුලින් පාංශු සංරක්ෂණය, කාබනික පොහොර භාවිතය, දිරි ගැන්වීම තුලින් ඉඩමේ භෞතික ගුණාංග නගා සිටුවන අතර, ආර්ථික බෝග හා දෛනික අවශ්‍යතාවන්ට ගැලපෙන බෝග විවිධාංගිකරණයවේ. මෙමගින් ග්‍රාමීය ඉඩම් ලාභීන්ගේ ආර්ථික ශක්තිය ගොඩ නැංවෙන අතර, පෝෂණ මට්ටම වැඩිදියුණු වීමද සිදු වේ. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුමක් තුලින් පුද්ගල සංවර්ධනය මෙන්ම දිගු කාලින භූමි සම්පතේ තිරසාර බව තහවුරු වනු ඇත.

උචිත ඉඩම් පරිහරණ සැලසුමට අදාළ ව්‍යාපෘති වාර්තාව සකස්කර ප්‍රාදේශීය මට්ටමෙන් සේවයේ යෙදී සිටින ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරියාගෙන් දිස්ත්‍රික් කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලයට අදාළ ව්‍යාපෘති වාර්තා අනුමැතියට යොමු කරයි.එයට අදාළ අනුමැතිය ලැබීමෙන් පසුව සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ)ගේ අධීක්ෂණ මත මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ. 2016 වර්ෂයේ ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන 50ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කල අතර 2016.12.31 වන විට ආදර්ශන 50මසාර්ථකව නිම කර ඇත.එක් වැඩසටහනක් සඳහා රු.50000.00 ක මුදලක් වෙන් කරන ලදී.

**2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන**

කොළඹ දිස්ත්‍රික්කය -සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



කළුතර දිස්ත්‍රික්කය - පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම්කොට්ඨාශය



කුරුණෑගල දිස්ත්‍රික්කය - උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



කුරුණෑගල දිස්ත්‍රික්කය - මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



## 5.7. භායනයට පත් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්

වැරදි භූමි භාවිතයත්, භූමිය නිසිලෙස කළමනාකරණය නොකිරීම නිසාත් එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික භූමි නැවත පුනරුත්ථාපනය කල නොහැකි තත්වයෙන් පහත වැටීම හෙවත් භූමි භායනයට පත් වෙමින් පවතී.මෙලෙසභායනයට ලක් වූ ඉඩම් සංරක්ෂණය කර ආදර්ශමත් ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ග හඳුන්වා දීම මගින් ආර්ථික හා සමාජීය වශයෙන් ජීවන තත්වය ඉහල නැංවීම මෙමගින් බලාපොරොත්තු වේ.

එමෙන්ම ඌන භාවිතයන් සහිත ඉඩම් ප්‍රසස්ථ ලෙස භාවිතයට ගැනීම සඳහා ඇති නිර්දේශ ක්‍රියාවට නැංවීම හේතුවෙන්, භූමියේ තිරසාර භාවය ඇතිවීම, අස්වැන්න ඉහල නැංවීම තුලින් භූමිය, පස, වනාන්තර හා ජලය ආරක්ෂා වීම සිදුවේ. මෙමගින් ජනතාවට අවශ්‍ය හිතෛශිපරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම සැකසේ.

2016 වර්ෂයේ මෙම වැඩසටහන් 25 ක් පැවැත්වීමට ඉලක්ක කල අතර එම වැඩසටහන් 25ම සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

## <u>2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද හායනයට පත්ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්</u>

බදුල්ල දිස්ත්‍රික්කය - මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

සංරක්ෂණයට පෙර දැනුවත්කිරීමේඅවස්ථාව





පාංශු සංරක්ෂණ අවස්ථාව පසු අවස්ථාව





කළුතර දිස්ත්‍රික්කය - අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මාතර දිස්ත්‍රික්කය - මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය





## 5.8. පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**ඵලදායි ලෙස ඉඩම් භාවිතා කිරීම පිලිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. රටේ අනාගත පරපුර මෙන්ම ගම තුලට ඉක්මනින් පණිවිඩ ගෙන යා හැකි ප්‍රධාන මාධ්‍ය වන පාසල් සිසුන් තිරසර සහ ප්‍රශස්ත භූමි පරිහරණය කිරීම සම්බන්ධ දැනුවත් කිරීම වර්තමාන මෙන්ම අනාගත ආයෝජනයක්ද වේ. අ.පො.ස.උසස් පෙළ භූගෝල විද්‍යා විෂය ධාරාවට ඉඩම් පරිහරණ සැලසුම් විෂයද ඇතුළත් කර ඇති බැවින් මෙම වැඩසටහන් පැවැත්වීම කාලීනව වැදගත් වී ඇත. එමෙන්ම ප්‍රජාව දැනුවත් කිරීම තුලින් ඔවුන් තුල පවතින වැරදි ඉඩම් භාවිතයන් අවම කිරීමටත්, මෙතෙක් භාවිතයට ගෙන නොමැති ඉඩම් භාවිතයට යොමු කිරීමත්,ඌන භාවිතා ඉඩම් ප්‍රශස්ථ භාවිතයට යොමු කිරීම, පස, වනාන්තර සහ ජලය ආරක්ෂා කිරීමට අවශ්‍ය ජනතාවගේ ආකල්ප වර්ධනය කිරීමට මෙමගින් හැකි වේ.ඒ තුලින් භූමිය තිරසර බවට පත් කිරීම අරමුණ වේ.**

**2016 වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 331ක් පැවැත්වීමට ඉලක්ක කල අතර වැඩසටහන් 333ක්සාර්ථකව පවත්වා ඇත. එක් වැඩසටහනක් වෙනුවෙන් රු.3000/= ක මුදලක් වෙන් කරන ලදී.**

**<u>2016 වර්ෂයේ පවත්වන ලද පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්</u>**

කළුතර දිස්ත්‍රික්කය - දොබගොඩ සීලරත්න ම.වි.



මඩකලපු දිස්ත්‍රික්කය - කෝරළේපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



මහනුවර දිස්ත්‍රික්කය - දොළුව -උඩදෙල්තොට ම.වි.



හම්බන්තොට දිස්ත්‍රික්කය - කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



## 5.9. විශේෂ අධ්‍යයන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ, ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමේ හෝ ගම් මට්ටමේ ජනතාවට දැඩිව බලපාන සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු හඳුනාගෙන සකස් කර එවනු ලබනව්‍යාපෘති යෝජනාවලින් නිර්මාණශීලිව ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා පරීක්ෂා කර බලා යෝග්‍ය වාර්තා සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ.ඒ අනුව 2016 වර්ෂයේ අධ්‍යනයන් 25ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කළ අතර එයින් අධ්‍යනයන 24 ක් නිම කරන ලදී.

කුරුණෑගල දිස්ත්‍රික්කය - බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය





## 5.10.වෙනත් ව්‍යාපෘති

### (I)උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ අනුව ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම LLRC.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ පදනම් කර ගෙන,ජාතික මට්ටමින් පත් කරන ලද විශේෂ කණ්ඩායම් මඟ පෙන්වීම යටතේ දිස්ත්‍රික් විශේෂඥ කණ්ඩායමක් මගින් උතුරු නැගෙනහිර

පළාතේ දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදී. එම වැඩසටහන් 2013 , 2014 හා 2015 වර්ෂ තුල දී ඉදිරියට ක්‍රියාත්මක කරනු ලැබීය .

LLRC වාර්තාවේ 9.152 ඡේදයේ සඳහන් පරිදි උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම මෙමගින් සිදු වේ.මේ යටතේ උතුරු නැගෙනගිර දිස්ත්‍රික්කයන්හි දැනටමත් ආරක්ෂා කර ඇති හා ආරක්ෂා කිරීමට යෝජිත ප්‍රදේශ ආරක්ෂා වීම හා සංරක්ෂණය වීම තුල එම ප්‍රදේශ වල ජිවත්වන ජනතාවට පාරිසරික සමතුලිතතාව හා ජෛව විවිධත්ව සංරක්ෂණය තුල දීර්ඝකාලින ප්‍රතිඵල ලැබීම මෙන්ම දිස්ත්‍රික්ක තුල හඳුනාගත් භාවිතයට නොගත් ඉඩම් කෘෂිකාර්මික හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා ප්‍රසස්ථ ලෙස යෙදවීම තුල ආර්ථික හා සමාජීය වශයෙන් ජිවන තත්වය ඉහල නැංවීමක් මෙමගින් අපේක්ෂා කෙරේ.

2015 වර්ෂය අවසන් වන විට සියලුම දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර කටයුතු අවසන් කර, ක්ෂේත්‍රයේදී මතු වූ ගැටළු සාකච්ඡා කිරීම හා ඊට විසඳුම් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ පාර්ශව කරුවන් දැනුවත් කිරීමේ රැස්වීම අවසන් කොට ඇත. දිස්ත්‍රික් මට්ටමේවිශේෂඥ කමිටු රැස්වීම් සියල්ලම අවසන්කර අදාල දිස්ත්‍රික්ක 08 හි දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් වාර්තා 2016 වර්ෂය තුලදී දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත බාරදී ඇත.

## (ii) පුනරුදය පාරිසරික සංරක්‍ෂණ ජාතික වැඩසටහන

ජනාධිපති ලේකම් කාර්යාලයේ මූල්‍යමය දායකත්වය මත පරිසර අමාත්‍යාංශයේද මැදිහත් වීමෙන් පුනරුදය ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා දිස්ත්‍රික් 11 කින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 44 ක භූමිය සංරක්ෂණය, ආරක්ෂා කිරීම හා භූමි පරිහරණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 44ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලැබී ඇත. මීට අමතරව රත්නපුර දිස්ත්‍රිකය සඳහා පුනරුදය ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන සඳහා රුපියල් මිලියන 5ක් ලබාදී ඇත.

නුවරඑළිය දිස්ත්‍රික්කය - නවරඑළිය පාදේශීය ලේකම් කොට්ඨාශය
ඉසුරු වැව ප්‍රතිසංස්කරණය




රත්නපුර දිස්ත්‍රික්කය - ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - අරබෙඹය




රත්නපුර දිස්ත්‍රික්කය - කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - අතුරුලියද්ද දොළ





(III)පරිසර අමාත්‍යාංශයේ හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍යමය දායකත්වයෙන් පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි ජෛව විවිධත්ව සංරක්ෂණ ප්‍රවර්ධනය හා පාරිසරික සේවා වල පැවැත්ම තහවුරු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කලා ඔය නිම්නයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06ක් සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම.

(IV) පරිසර අමාත්‍යාංශයේ මූල්‍යමය දායකත්වය යටතේ වේලිඔය ජලපෝෂක ප්‍රාදේශීයන්හි එනම් බදුල්ල, මොනරාගල, රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි භූමිපරිහරණ වර්ගීකරණය සහ භූමි ශක්‍යතා සිතියම් සැකසීම.

(V)භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ දෙපර්තමෙන්තුවේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුර තාක්ෂණ ඒජන්සියේ ( ICTA) සහභාගිත්වය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 5.11. වාර්ෂික වැඩ සැලැස්ම පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වීම

2017 වසරේ වැඩ සැලැස්ම පිළිබඳව දැනුවත් කිරීම සඳහා, 2016 වසරේ අවසන් කාර්තුව තුල දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වෙනුවෙන් (සහකාර අධ්‍යක්ෂ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ / ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි/ /සංවර්ධන නිලධාරීන්/ ශිල්පිය සහායක )මෙම වැඩමුළුව පළාත් මට්ටමින් පළාත් 9හි පවත්වනු ලැබිය.

## 2016 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව විසින් පළාත් මට්ටමින් පවත්වන ලද වැඩමුළු අවස්ථාවන්

නැගෙනහිර පළාත් වැඩමුළුව





උතුරු මැද පළාත් වැඩමුළුව





## 5.12. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය

**2016 වර්ෂයට අදාලව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය වගුවෙන් දැක්වෙන අතර එය ප්‍රස්ථාරිකව ද වැඩිදුරටත් පැහැදිලි කොට ඇත.**

**<u>දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය -2016</u>**

| වැඩසටහන | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් | 55 | 64 |
| ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් | 331 | 392 |
| ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් කිරීම | 50 | 50 |
| හායනයටපත් ඉඩම් පුනරුත්තාපන වැඩසටහන් | 25 | 25 |
| පාසල් සිසුන් හා ප්‍රජාවදැනුවත් කිරීමේ වැඩසටහන් | 331 | 333 |
| විශේෂ අධ්‍යයන | 25 | 24 |
| ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණ (සිතියම් ගණන) | 1830 | 1519 |
| ජලමූලාශ්‍ර හා ජල උල්පත් සංරක්ෂණය (වැඩසටහන් ගණන) | 25 | 25 |
| ප්‍රදේශීය ඉඩම් පරිහරණ සැලසුම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම (වැඩසටහන් ගණන) | 330 | 330 |

## දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය -2016

